**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**10 ශ්‍රේණිය　　　භූගෝල විද්‍යාව　　　ඔක්තෝම්බර් 2 සතිය**

**නිපුණතාව ඃ-** භෞතික හා මානුෂ ක්‍රියාවලින්ගේ අන්තර් ක්‍රියා භෞතික හා මානුෂ පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම ඃ-** ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ව්‍යාප්තිය, ලක්ෂණ හා ගැටලු පැහැදිලි කරයි.

**මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් පල ඃ-**

* ශ්‍රී ලංකාවේ කර්මාන්ත ව්‍යාප්තියට බලපෑ සාධක ඉදිරිපත් කරයි.
* ව්‍යාප්තිය දැක්විය හැකි කර්මාන්ත ස්ථානගත වීම ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කරයි.
* එක් එක් කර්මාන්ත පවත්වා ගෙන යාමේ දී ඇති වන ගැටළු අවම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරයි.
* එක් එක් කර්මාන්ත ආශ්‍රිත නව ප්‍රවණතා පිළිබඳ අදහස් දක්වයි.
* තෝරාගත් කර්මාන්තවල වත්මන් තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීමක් කරයි.
* ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කර්මාන්තවල වැදගත්කම පැහැදිලි කිරීමට කරුණු ඉදිරිපත් කරයි.

**පාඩම ඃ-** ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය, ගැටලු හා ප්‍රවණතා - විද්‍යුත් කර්මාන්තය හා පෙට්‍රෝ රසායන කර්මාන්තය

**ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් ඃ-**

10 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළ පොතෙහි පිටු අංක 123 සිට 126 තෙක් හොඳින් කියවන්න. පහත දක්වා ඇති උපයෝගී කරගත හැකි පොත්පත් හා ඉගෙනුම් ආධාරකද පරිශීලනය කර වැඩිදුර අධ්‍යයනය කරන්න.

- ❖ විද්‍යුත් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන සඳහා දේශීය ඉල්ලුම ඉහළ යාම මෙරට විද්‍යුත් කර්මාන්තය දියුණු වීමට හේතුවකි.
- ❖ එකලස් කිරීමේ කර්මාන්තයක් වශයෙන් ඇතැම් නිෂ්පාදන විදේශ වෙළඳපලටද අපනයනය කෙරේ.
- ❖ විද්‍යුත් උපකරණ නිපදවීමේ කර්මාන්ත කොළඹ හා තදාසන්න ප්‍රදේශවල ද, ආයෝජන ප්‍රවර්ධන කලාප ආශ්‍රිතවද ව්‍යාප්තව පවතී.
- ❖ පෙට්‍රෝලියම් පිරිපහදුවේ පැට්‍රල්, ඩීසල්, භූමි තෙල් යන ප්‍රධාන ද්‍රව ඉන්ධන හා ගෑස් ලබා ගැනීමෙන් අනතුරුව ඉතිරි වන ද්‍රව්‍ය ඇසුරෙන් පෙට්‍රෝ රසායන කර්මාන්තය පවත්වාගෙන යනු ලැබේ.

- ❖ පෙට්‍රෝ රසායන කර්මාන්තය, අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව මත ශ්‍රී ලංකාවේ තෙල් පිරිපහදුකිරීමේ කර්මාන්තශාලාවට ආසන්නව කොළඹ තදාසන්න ප්‍රදේශවල හා ආයෝජන ප්‍රවර්ධන කලාපයන්හි ස්ථානගත වී ඇත.
- ❖ මෙම කර්මාන්තය නව තාක්ෂණික ක්‍රමශිල්ප හා යන්ත්‍ර සූත්‍ර බහුල ලෙස භාවිත කරනු ලබන ප්‍රාග්ධන සූක්ෂම කර්මාන්තයකි.

**ක්‍රියාකාරකම**

01. මෙරට විද්‍යුත් කර්මාන්තය ඉතා මෑතකදී ආරම්භ වුවද වර්තමානයේ දියුණු වෙමින් පවතින කර්මාන්තයක් වීමට හේතු මොනවාද?
02. විද්‍යුත් කර්මාන්තය පවතින්නේ කුමන කර්මාන්තයක් යටතේද?
03. විද්‍යුත් කාර්මික නිෂ්පාදන විදුලි උපකරණවලින් වෙනස්වන ආකාරය ලියන්න.
04. ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් කර්මාන්තයේ ව්‍යාප්තිය සඳහන් කරන්න.
05. විද්‍යුත් කර්මාන්තය ආශ්‍රිතව පැන නැගී ඇති ගැටලු පහක් දක්වා දෙකක් පැහැදිලි කරන්න.
06. විද්‍යුත් කර්මාන්ත ක්ෂේත්‍රය තුළ දක්නට ඇති ප්‍රවණතා තුනක් ලියන්න.
07. පෙට්‍රෝ රසායන කර්මාන්තය යන්න කෙටියෙන් හඳුන්වන්න.
08. පෙට්‍රෝ රසායන කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන ලැයිස්තුවක් සකසන්න.
09. පෙට්‍රෝ රසායන කර්මාන්තය ආශ්‍රිත ගැටලු හා ප්‍රවණතා තුන බැගින් ලියන්න.
10. ශ්‍රී ලංකාව තුළ පෙට්‍රෝ රසායන කර්මාන්තයෙහි ව්‍යාප්තිය ලියා දක්වන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි පොත්පත් හා ඉගෙනුම් ආධාරක ඃ-**


- Geological Survey and Mines Bureau, Sri Lanka Minerals Year Book – (2012)
- The National Atlas of Sri Lanka (2007)
- කාර්ය සමාලෝචනය (2012), කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය.
- මානුෂ භූගෝල විද්‍යාව, දෙවන කොටස (2009), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව (2012), ශ්‍රී ලංකා මහ බැංකුව.
- හේරත් ජේ. ඩබ්. (1979), ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත්, භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව.
- e නැණ පියස - (enenapiyasa.lk)
- හොරණ කලාප අධ්‍යාපන කාර්යාලය - සවියනේ පෙරට යූ ටියුබ් නාලිකාව https://www.saviyenperata.com/